සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව
சமுர்த்தி அபிவிருத்தி திணைக்களம்
Department of Samurdhi Development

ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබලගැන්වීම් අමාත්‍යාංශය
ஆரம்ப கைத்தொழில் மற்றும் சமூக வலுவூட்டல் அமைச்சு
MINISTRY OF PRIMARY INDUSTRIES AND SOCIAL EMPOWERMENT

මගේ අංකය / எனது இல / My No: DSD/HO/07/SD/05/01– SK/2019
ඔබේ අංකය / உமது இல / Your No: ……………………………
දිනය / திகதி / Date: 2019.06.12

සියලුම දිස්ත්‍රික් අතිරේක අධ්‍යක්ෂ ජනරාල්වරුන්/ දිස්ත්‍රික් ලේකම්වරුන්,

සියලුම දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂකවරුන්,

සියලුම ප්‍රාදේශීය ලේකම්වරුන්,

**සමෘද්ධි කැකුළු ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය ජාතික තරඟාවලිය - 2019**

සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව යටතේ සමෘද්ධි කැකුළු ළමා සමාජයන්හි ගොනුගත වූ විවිධ කුසලතාවයන් ඇති දරුවන්ගේ සාහිත්‍ය හා සෞන්දර්ය කුසලතාවයන් තවදුරටත් ඔප් නැංවීම සඳහා 2019 වසරේදී ද සමෘද්ධි කැකුළු ළමා සමාජ සාහිත්‍ය හා සංස්කෘතික තරඟාවලිය (සිංහල/දමිළ) බැංකු කලාප, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස, දිස්ත්‍රික් හා ජාතික මට්ටමින් වයස් කාණ්ඩ 3 ක් ඔස්සේ පැවැත්වීමට තීරණය කර ඇත.

02. 2002 වසරේ සිට 2018 වසර දක්වා ඉහත ජාතික තරඟාවලිය සාර්ථකව ක්‍රියාත්මක කිරීම සඳහා ඔබ හා ඔබගේ කාර්යය මණ්ඩලය දැක්වූ සහයෝගය ස්තූති පූර්වකව සිහිපත් කරමි. සමාජ සංවර්ධන වැඩසටහන තුළ ක්‍රියාත්මක කරනු ලබන සියලුම වැඩසටහන්වල මුඛ්‍ය පරමාර්ථය සමාජය වෙත ගෙන යාමට හැකියාව ඇති පාර්ශවකරුවන් ලෙස, ළමා සමාජ සමඟ එකතු වී ඇති දරුවන් හැඳින්විය හැකි අතර වාර්ෂිකව ක්‍රියාත්මක වන ළමා සමාජ සංස්කෘතික හා සාහිත්‍ය තරඟාවලියට අමතරව ළමා සමාජ දරුවන් සමාජ සංවර්ධන හා පරිසර වැඩසටහන් ක්‍රියාත්මක කිරීම සඳහා ද සම්බන්ධ කරගැනීමට ද අපේක්ෂා කෙරේ.

03. මෙහිදි ග්‍රාමීය ප්‍රජාවගේ ජන ජීවිතය උසස්ව පවත්වා ගැනීමට ප්‍රමුඛතාවය ලබා දෙමින්, අධ්‍යාත්මික සංවර්ධනය තුළින් ආර්ථික සංවර්ධනය ජය ගැනීමට <u>ප්‍රබල ප්‍රතිරෝධකයක්ව පවතින මත් හා දුම්වැටි භාවිතයට විරුද්ධ මතයක් ගොඩ නඟමින් මත් හා දුම්වැටි භාවිතය ජන ජීවිතයට කොතරම් බලපෑම් කරන්නේ ද යන්න තේමාව කරගත් පණිවුඩ රැගත් බැනර්</u> බැංකු සංගම්හි, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් තරඟ පැවැත්වෙන ස්ථානයන්හි ප්‍රදර්ශනය කළ යුතුය. මේ බැනර් ආදර්ශයට ගත හැකි ආකෘති 04 ක් ඇමුණුම අංක 07 හි සඳහන් වේ. ආකෘති 04 ම මුද්‍රණය කර ප්‍රදර්ශනය කිරීම වඩාත් යෝග්‍ය වේ. එක් බැනරයක් අඩි 06

1වන අදියර,4 වන මහල, සෙත්සිරිපාය, බත්තරමුල්ල. /1ம் கட்டம், 4 வது மாடி,செத்சிறிபாய பத்தரமுல்ல /1st Step, 4 th floor, Sethsiripaya Battaram

Tel- / Fax - / E-mail-

අධ්‍යක්ෂ ජනරාල් / பணிப்பாளர் தலைமையதிபதி / Director General
011-2871672/2872202
011-2889002
dg@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (පාලන හා ආයතන) / பணிப்பாளர் ( நிர்வாகம்/தாபனம்) / Director (Admin & Establishment)
011-2873799
011-2873996
diradmin@samurdhi.gov.lk
Hot Line :0112-889007

ප්‍රධාන ගණකාධිකාරී / பிரதான கணக்காளர் / Chief Accountant
011-2869742
011-2869742
finance@samurdhi.gov.lk

අධ්‍යක්ෂ (ක්ෂුද්‍ර මූල්‍ය) / பணிப்பாளர் (குறு நிதி ) / Director ( Micro Finance)
011-2889003
011-2887469
Hot Line:0112-885582

කාර්යාලය / அலுவலகம் / Office
0112872202
Hot Line: 011- 288

ක් දිග සහ පළල අඩි 03 ක් විය යුතුය. එක් බැනරයක් සඳහා උපරිමව වියදම් කළ හැක්කේ රු.1,000/- කි. සමෘද්ධි වැඩසටහනට නව ප්‍රචාරණයක් ලබා දීම සඳහා බැංකු සංගමයක් එක බැනරයක් හෝ ප්‍රදර්ශනය කළ යුතුයි.

04. බැංකු සංගම්, ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටම්වලදී තරග අංශ විනිශ්චය කිරීම සඳහා ඒ ඒ විෂයන් සඳහා නිපුණතාවයකින් යුතු නිලධාරීන් පත් කර ගත යුතු අතර එසේ පත් කර ගන්නා විනිශ්චය මණ්ඩලය ප්‍රාදේශීය ලේකම් හා දිස්ත්‍රික් ලේකම් විසින් අනුමත කළ යුතු වේ.

05. ඉහත 03 ඡේදයෙහි පරිදි බැනර් සඳහා වන වියදම ද, බැංකු සංගම් මට්ටමේ තරග සඳහා උපරිම රු.10,000/- ක් හා ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශ මට්ටමේ තරඟ සඳහා රු. 20,000/- ක උපරිමයකට යටත්ව සමෘද්ධි කොඩි වැඩසටහනින් රැස්කරන ලද මුදලින් අදාල ප්‍රජා මූල සංවිධාන හරහා හෝ අවශ්‍ය පරිදි සමාජ සංවර්ධන පදනම්වලින් හෝ වැය දැරීමට අවශ්‍ය කටයුතු කිරීම සඳහා අනුමැතිය ලබාදෙන අතර ඒ අනුව ඉදිරි කටයුතු සංවිධානය කළ යුතුය. දිස්ත්‍රික් තරඟ සඳහා වියදම් ඇස්තමේන්තුව ප්‍රධාන කාර්යාලයට ඉදිරිපත් කිරීමෙන් අනතුරුව ප්‍රතිපාදන නිදහස් කිරීමට කටයුතු කෙරේ.

06. තරගාවලිය සම්බන්ධ පොදු උපදෙස් පහත පරිදි දැක්වෙන අතර ඒ අනුව ඉදිරි කටයුතු ක්‍රියාත්මක කළ යුතුය.

- o ඇමුණුම අංක 01 - පොදු තරඟ කොන්දේසි
- o ඇමුණුම අංක 02 - තරඟ විස්තර
- o ඇමුණුම අංක 03 - සිංහල මාධ්‍ය තරඟ ඉසව්
- o ඇමුණුම අංක 04 - දමිළ මාධ්‍ය තරඟ ඉසව්
- o ඇමුණුම අංක 05 - කාල රාමුව / ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම
- o ඇමුණුම අංක 06 - ළමා කතන්දර ලකුණු සටහන් කිරීම (කලාප මට්ටමේ සිට)
- o ඇමුණුම අංක 07 - බැනර් සඳහා ආකෘති

07. පසු ගිය වසර වල මෙන් ප්‍රාදේශීය හා දිස්ත්‍රික් මට්ටමේ පවත්වන තරඟවලදී ජයග්‍රාහී දරුවන් සඳහා ලබා දීමට නියමිත සහතික පත්‍ර ආකෘති දෙක සඳහා වන ග්‍රැෆික් සැලසුම් දෙක විද්‍යුත් තැපැල මඟින් ලබා ගන්නා ලෙසද කාරුණිකව දන්වමි.

එස්.ඊ.ආර්.ටී.එම්.එස්.පී. බණ්ඩාර

අධ්‍යක්ෂ ජනරාල්

පිටපත් : -

| | |
|---|---|
| ලේකම්, ප්‍රාථමික කර්මාන්ත සහ සමාජ සවිබල ගැන්වීම් අමාත්‍යාංශය | - කරු. දැ.ගැ.ස |
| ප්‍රධාන ගණකාධිකාරි, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| ප්‍රධාන අභ්‍යන්තර විගණක, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| සියලුම අධ්‍යක්ෂවරුන්, සමෘද්ධි සංවර්ධන දෙපාර්තමේන්තුව | - කරු. දැ.ගැ.ස |
| සියලුම කළමනාකරණ අධ්‍යක්ෂවරුන්/මුලස්ථාන කළමනාකරු | - කරු. දැ.ගැ.ස |
| සියලුම බැංකු කලාප කළමනාකරුවන් | - කරු. දැ.ගැ.ස |

**පොදු තරඟ කොන්දේසි - ඇමුණුම 01**

I. මෙම තරඟාවලිය සිංහල හා දමිළ යන භාෂා ද්විත්වයෙන්ම පැවැත්විය යුතු අතර ඒ ඒ මාධ්‍යවල දරුවන් නියමිත මාධ්‍යයෙන් පමණක් තරඟ කළ යුතුයි. යම් දමිළ හෝ මුස්ලිම් දරුවෙක් සිංහල මාධ්‍යයෙන් අධ්‍යාපනය හදාරන්නේනම් ඒ දරුවාට සිංහල මාධ්‍යයෙන් තරඟ කළ හැකිය. සිංහල මාධ්‍ය සඳහා තරඟ ඉසව් 14 ක් ද, දමිළ මාධ්‍ය තරඟ ඉසව් 10 කින්ද තරඟාවලිය සමන්විත වේ.

II. වයස් කාණ්ඩ පහත සඳහන් පරිදි වේ

| අනු අංකය | වයස් කාණ්ඩය | විස්තරය |
|---|---|---|
| 01 | අවුරුදු **15 –18**<br>**2001.12.31** සිට **2005.12.30** දක්වා | (2001.12.31 දින සිට 2002, 2003, 2004, 2005.12.30 දක්වා අතරතුර කාලයෙහි ඉපදුන දරුවන් මෙම වයස් කාණ්ඩය සඳහා ඇතුලත්වේ.)<br>2019. 12. 31 / 2001. 12. 31 / අවු: 18. 00. 00<br>2019. 12. 31 / 2005. 12. 30 / අවු: 14. 00. 01 |
| 02 | අවුරුදු **11 –14**<br>**2005.12.31** සිට **2009.12.30** දක්වා | (2005.12.31 දින සිට 2006, 2007, 2008, 2009.12.30 දක්වා අතරතුර කාලයෙහි ඉපදුන දරුවන් මෙම වයස් කාණ්ඩය සඳහා ඇතුලත්වේ.)<br>2019. 12. 31 / 2005. 12. 31 / අවු: 14. 00. 00<br>2019. 12. 31 / 2009. 12. 30 / අවු: 10. 00. 01 |
| 03 | අවුරුදු **7 –10**<br>**2009.12.31** සිට **2013.12.30** දක්වා | (2009.12.31 දින සිට 2010, 2011, 2012, 2013.12.30 දක්වා අතරතුර කාලයෙහි ඉපදුන දරුවන් මෙම වයස් කාණ්ඩය සඳහා ඇතුලත් වේ.)<br>2019. 12. 31 / 2009. 12. 31 / අවු: 10. 00. 00<br>2019. 12. 31 / 2013. 12. 30 / අවු: 6. 00. 01 |

iii. සමෘද්ධි කැකුළු ළමා සමාජ සාමාජික සාමාජිකාවන් පමණක් මෙම තරඟයට සහභාගි විය යුතු අතර **සමෘද්ධි බැංකුවේ ගිණුමක් තිබීම අනිවාර්ය වේ. (සමෘද්ධි බැංකුවේ ගිණුමක් නොමැති කිසිම දරුවෙකු තරඟ සඳහා ඉදිරිපත් නොකළ යුතු බවට අවධාරණය කරමි.)** තරඟයේ මූලික අදියර කලාප මට්ටමින් ආරම්භ වීමත් සමඟම සමෘද්ධි බැංකුවල දරුවන් සඳහා ළමා ගිණුම් (කැකුළු / සිසුරක) ආරම්භ වී තිබිය යුතුය. නව ගිණුමක් නම් අවමය රු.500/- ක ශේෂයක් හා පැරණි ගිණුමක් නම්. රු.1,000/-ක අවම ශේෂයක්වත් තිබිය යුතුය. **මෙහි මූලික අරමුණ වන්නේ දරුවන්ගේ ඉතිරි කිරීම් ප්‍රවර්ධනය කිරීම වේ.**

iV. තරඟයෙන් තරඟයට බැංකු පොත්, උප්පැන්න සහතිකය ආදි සුදුසුකම් පරීක්ෂා කර බැංකු ගිණුම ආරම්භ කළ දිනය ඇතුලත්ව ලේඛනය සකස් කර කලාප මට්ටමේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස්කළ ලේඛනයද සහිතව කළමනාකාර අධ්‍යක්ෂ වෙතත්, ප්‍රාදේශීය තරඟාවලියේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස් කළ ලේඛනය දිස්ත්‍රික් සමාජ සංවර්ධන කළමනාකරු වෙතත් දිස්ත්‍රික් තරඟාවලියේදී ජයග්‍රාහී දරුවන් ලබා ගන්නා ලකුණු හා සකස්කළ නාම ලේඛනය **නියමිත දිනට** ප්‍රධාන කාර්යාලය වෙතත් ලැබීමට සැලැස්විය යුතුය.

V. උඩරට නර්තන (ඒකල) සහ පහතරට නර්තන (ඒකල) වාදක මණ්ඩලය සඳහා දෙදෙනෙකු විය යුතු අතර මේ සඳහා ශිල්පීන් යොදා ගත හැකිය. ගායනය සඳහා ළමා සමාජ දරුවන් දෙදෙනෙකු යොදා ගත හැකිය. **(ඕනෑම වයස් කාණ්ඩයකින් ගායනා කල හැකිය)**

Vi මීට පෙර වර්ෂ වලදී ජාතික මට්ටමේ තරඟයෙන් ප්‍රථම ස්ථානය හිමිකර ගත් තරඟකරුවෙකු හට නැවත එම වයස් කාණ්ඩයෙන් තරඟ කිරීමට නොහැකි අතර **එක් දරුවෙකුට එක් තනි තරඟ ඉසව්වකට හා කණ්ඩායම් තරඟ ඉසව්වකට පමණක් සහභාගී විය හැකිය.**

vii. කණ්ඩායම් තරඟ වලදී නර්තනය සඳහා දරුවන් 12 ක් ද ගායනය සඳහා දරුවන් 4 දෙනෙකුටද සහභාගි විය හැකිය. වාදනය සඳහාද 4 දෙනෙක් විය යුතු අතර ඒ සඳහා ශිල්පීන් යොදා ගත හැකි අතර වයස් සීමාවක් නොමැත. වාදනයට හැර සහභාගී විය හැකි උපරිම ප්‍රමාණය 16කි. අවමය ගායනයද ඇතුලත්ව 10 කි.

**Viii. මුළු තරඟාවලිය පුරාවටම ( කලාප ,ප්‍රාදේශිය, දිස්ත්‍රික්, ජාතික) නර්තනයේ යෙදීමට අවශ්‍ය වාදනය සැපයීම සඳහා සීඩී තැටි / පෙන්ඩ්‍රයිව් භාවිතා කිරීම ජංගම දුරකථන පටිගත කිරීම් ආදිය සම්පූර්ණයෙන්ම තහනම් වේ.**

IX කලාප, ප්‍රාදේශීය, දිස්ත්‍රික් තරඟයේදී විනිශ්චය මණ්ඩලය සඳහා තුන් දෙනෙක් සහභාගී කරවීම අනිවාර්ය වන අතර නිළ වශයෙන් ප්‍රතිඵල ප්‍රකාශයට පත් කරන තෙක් අදාළ නොවන කිසිම අයෙකුට විනිශ්චය මණ්ඩලයේ ලකුණු දැනගැනීමට සැලැස්වීමට නොකළ යුතුය. අදාළ නීති රීති පිළිබඳ විනිශ්චය මණ්ඩලය දැනුවත් කළ යුතුය.

X. කලාප තරඟය පැවැත්විමේදි බැංකු ගිණුමක් නොමැති දරුවෙක් යම් හෙයකින් තරඟයට ඉදිරි පත් වුවහොත් හා යම් අක්‍රමිකතාවක් සිදු වුවහොත් එහි වගකීම කලාප මට්ටමේදි කලාප කළමණාකරු විසින්ද ප්‍රාදේශීය මට්ටමේදි කළමණාකාර අධ්‍යක්ෂ/ මුලස්ථාන කළමණාකරු විසින්ද දිස්ත්‍රික් මට්ටමේදි දිස්ත්‍රික්

විෂය කළමණාකරු විසින්ද දැරිය යුතුය. අදාළ වයස් සීමාව ඉක්මවූ දරුවන් මෙම තරඟාවලිය සඳහා සහභාගී නොවිය යුතුය.

xi.තරඟ සඳහා ඉදිරිපත් වන දරුවන් තමන්ගේ අනන්‍යතාවය පිළිබිඹු වන සේ සුදුසු ඇඳුමකින් සැරසී සිටීම අනිවාර්‍යය් වේ. (ජන නැටුම් හැර) (උදා:- ගැහැණු දරුවන් ළමා සාරියකින්, පිරිමි දරුවන් ජාතික ඇඳුමකින්.)

xii.අදාළ මට්ටම් වලදී තරඟාවලියේදී තරඟ පැවැත්වීමෙන් ජයග්‍රහණය කරන තරඟකරුවන් පමණක් ඉදිරි තරඟ වලට ඉදිරිපත් කළ යුතු අතර තරඟ අයිතමයන් සඳහා අවම වශයෙන් තරඟකරුවන්/තරඟ කණ්ඩායම් 5 ක් වත් සිටිය යුතුය. ( සියළු තරඟ ඉසව් සඳහා මෙය අදාල වේ.)

xiii ජාතික තරඟයේදී ජයග්‍රාහී දරුවන් සඳහා මුල්‍යමය ත්‍යාග ඔවුන්ගේ බැංකු ගිණුම් වලට (සිසුරක / කැකුළු) බැර කිරීමට කටයුතු කෙරේ. ජාතික තරඟාවලිය අවසානයේදී අදාළ දිස්ත්‍රික්ක වෙත පහත සඳහන් අයුරින් මුදල් නිදහස් කරනු ඇත. ජාතික තරඟාවලියෙන් පසු ජයග්‍රාහි දරුවන්ගේ ත්‍යාග මුදල් දිස්ත්‍රික් සඳහා යොමු කරන අතර අදාළ දරුවන්ගේ ගිණුම් වලට එම ත්‍යාග මුදල් බැර වූ බවට ලිඛිතව ප්‍රධාන කාර්යාලය වෙත ලැබීමට සැලැස්විය යුතුය. තවද දිස්ත්‍රික් මට්ටමින් ජයග්‍රහණය කරන දරුවන් සඳහා ත්‍යාග මුදල් ලබා දීමේදී පහත දි ඇති මුදල් සීමාවන් නොඉක්මවිය යුතු බව වැඩිදුරටත් දන්වමි.

| ස්ථානය | ඒකල | සමූහ |
|---|---|---|
| | ජාතික | ජාතික |
| ප්‍රථම | 10,000/- | 40,000/- |
| දෙවන | 6,000/- | 30,000/- |
| තෙවන | 4,000/- | 20,000/- |
| කුසලතා (දෙකකි) | (එකකට) 1,500/- | (එකකට) 10,000/- |

xiv. තරඟ සඳහා දරුවන් යොමු කිරීමේ දී ව්‍යාජ හා වංචා සහගත කටයුතු කිසිවක් නොවිය යුතු අතර එවැනි අක්‍රමිකතාවයන් ඇති වුවහොත් අදාළ නිලධාරින් සඳහා විනයානුකූල පියවර ගැනීමට සිදුවන බව දන්වමි. විනිශ්චය මණ්ඩලවල තීරණ අවසන් තීරණ විය යුතු අතර කිසිදු නිලධාරියකුගේ බලපෑමක් ඒ සඳහා නොවිය යුතුබව තරයේ අවධාරණය කරමි.

**තරඟ විස්තර - ඇමුණුම 02**

සියලු තරඟ විස්තර පහත වගුවේ ඇති පරිදි වන අතර චිත්‍ර, ළමා කතන්දර, කෙටි නාට්‍ය, ගද්‍ය රචනා, පද්‍ය රචනා සඳහා පමණක් වැඩි විස්තර පහත පරිදි වේ.

- චිත්‍ර තරඟය සඳහා අඟල් 18 x 14 ප්‍රමාණයේ බ්‍රිස්ටල් බෝඩ් හෝ ඩ්‍රෝවින් කඩදාසි භාවිතා කල යුතුය. එළිය, අඳුර සහ ත්‍රිමාන ලක්ෂණ පිළිබිඹු වන අයුරින් චිත්‍ර සංරචනයක යොදවන්න. ප්‍රකාශන චිත්‍ර පමණක් නිර්මාණය කළ යුතු අතර මෝස්තර චිත්‍ර ඇඳීම නොකළ යුතුය. **ප්ලැටිග්නම් හා කාබන් පැන් භාවිතා නොකළ යුතුයි.**
- ළමා කතන්දර තරඟය සඳහා පැය 3 ක කාලයක් ලබා දී දරුවන්ට තම තේමාව මූලික කර ගත් නිර්මාණශීලී ළමා කතන්දරය ලිවීමට අවස්ථාවක් ලබා දී නිම කළ කෘතිය ලබා ගැනීමෙන් අනතුරුව එය බැංකු සංගම් මට්ටමේදී, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමේදී හා දිස්ත්‍රික්, ජාතික මට්ටම්වලදී එම කතන්දර පොත ඉදිරිපත් කළ යුතු වේ. එසේ සකසන ලද පොතේ පසු පිටෙහි ලකුණු දීම සඳහා අදාළ ආකෘතිය භාවිතා කිරීම අනිවාර්ය වේ. (ඇමුණුම අංක - 06) ළමා කතන්දර කෘතිය නිර්මාණය කර භාර ගැනීමේදී එම පරීක්ෂණ මණ්ඩලය, දරුවා විසින් තරඟයට සහභාගී වී නිර්මාණය කළ කෘතියක් බවට සහතික කළ යුතුය.
- සහතික කළ උප්පැන්න සහතිකය හා ලකුණු ලබා දීමේ ආකෘතිය පොතෙහි නොගැලවෙන සේ අමුණා **"ළමා කතන්දර නිර්මාණය"** පමණක් අදාළ දිනට හෝ ඊට පෙර ලැබීමට සැලැස්විය යුතු වේ. එසේ නොමැති පොත් තරඟයෙන් ප්‍රතික්ෂේප වේ.
- ළමා කතන්දර තරඟ ඉසව්ව සඳහා ජාතික මට්ටමේ දී දරුවන් ඉදිරිපත් නොකළ යුතු අතර ඔවුන් විසින් නිර්මාණය කරන ලද **"ළමා කතන්දර නිර්මාණය"** හි තරඟකරුගේ නම, වයස් කාණ්ඩය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, හා දිස්ත්‍රික්කය පැහැදිලිව සඳහන් කළ යුතු වේ.
- කෙටි නාට්‍ය තරඟ ඉසව්ව සඳහා අදාළ වන **ආධ්‍යාත්මික සංවර්ධනය , සාමාජීය වශයෙන් සමාජයට යහපත් පණිවුඩයක් ලබා දිය හැකි තේමාවක් තෝරා ගත යුතුවන අතර. අවම වේදිකා සැරසිලි යොදා ගත යුතුවේ. (වේදිකාව සූදානම් කිරීම සඳහා විනාඩි 05 කට වඩා යොදා ගන්නේනම් ලකුණු අඩු වීමට හේතුවක් වේ.)**
- ගද්‍ය හා පද්‍ය රචනා සඳහාද පැය 2 ක කාලයක් ලබා දී පරිසරය රැක ගැනීම හා ස්වභාව සෞන්දර්ය, ජන ජීවිතය සමඟ බැඳී ඇති අයුරු වැනි මාතෘකාවක් ඔස්සේ වර්ණනාත්මකව නිර්මාණය කළ යුතුය.

**<u>සිංහල මාධ්‍ය තරඟ ඉසව් - ඇමුණුම 03</u>**

| අනු අංකය | තරඟ ඉසව් | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | සරල ගී ගායනය (ඒකල) | 7 - 10 | විනාඩි 3 - 5 | මව් ගුණ, පිය ගුණ ගීතයක් හෝ දේශාභිමානි ගීතයක් ගායනා කළ යුතුය. |
| | | 11 - 14 | | |
| | | 15 - 18 | | |
| 02 | ශාස්ත්‍රීය ගායනය (ඒකල) | 7 - 10 | විනාඩි 3 - 5 | රාගය - බිලාවල්, කාෆි, භූපාලි මින් එක් රාගයක් ගායනා කළ යුතුය.(තානාලංකාර සහිතව) |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | රාගය- භීම්පලාශ්‍රී ,ආශාවරි, දේශ්.<br>මින් එක් රාගයක් ගායනා කළ යුතුය.<br>(ආලාප තානාලංකාර සහිතව) |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | රාගය-භාගේශ්‍රී, මාලකෞන්ස්, බහාර්. මින් එක් රාගයක් ගායනා කළ යුතුය. (ආලාප තානාලංකාර සහිතව) |
| 03 | ශාස්ත්‍රීය වාදනය | 11 - 14 | විනාඩි 4 - 6 | රාගය- ආශාවරි, දේශ්, භූපාලි.<br>මින් එක් රාගයක් වාදනය කළ යුතුය.<br>(ආලාප තානාලංකාර සහිතව) |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | රාගය-තිලක්කාමෝද්, ජයජයවන්ති, බහාර්. මින් එක් රාගයක් වාදනය කළ යුතුය.<br>(ආලාප තානාලංකාර සහිතව)<br>තෝරා ගත් එක් වාද්‍ය භාණ්ඩයකින් පමණක් තරඟ කළ යුතුය. වයලීන්, සිතාර්, එස්රාජ්, බටනලා යන භාණ්ඩ පමණකි. |
| 04 | ජන ගායනය (ඒකල) | 7 – 10 | විනාඩි 3 - 5 | ආසාතාත්මක (තාල සහිත) හා අනාසාතාත්මක (තාල රහිත) වශයෙන් ගීත තෝරාගත යුතු අතර ඒවා ප්‍රාසංගිකව ඉදිරිපත් කළ යුතුය.<br>උදා:-<br>01. සී පද (පැල්,පතල්,බඹර )<br>02. ශාන්ති කර්ම<br>03.නෙළුම්ඔසේ<br>04.වැලපුම් ගී<br>05.රබන් ගී<br>06.ගොයම් ගී<br>මෙයින් ඔබ කැමති ජන ගායනා ශෛලීන් කිහිපයකට අයත් කවි තෝරා ගත හැකිය. |
| | | 11 - 14 | විනාඩි 4 - 6 | |
| | | 15 - 18 | විනාඩි 5 - 7 | |

| | | | | |
|---|---|---|---|---|
| 05 | ජන නැටුම් (සමූහ හෝ මිශ්‍ර) (සාම්ප්‍රධායික ජන නැටුම් ආශ්‍රයෙන්) | 7 – 10<br>11 – 14<br>15 - 18 | විනාඩි<br>5 – 7 | නර්තනය - 12<br>අත්වැල් ගායනය - 04<br>(ළමා සමාජ දරුවන් විය යුතුය.)<br>වාදක මණ්ඩලය සඳහා ශිල්පීන් - 04<br>කණ්ඩායමේ උපරිම සංඛාව 16 ක් විය යුතු අතර අවමය 10 ක් විය යුතුය. ) |
| 06 | උඩරට - ඒකල ගැහැණු/පිරිම | 11 – 14<br>15 - 18 | විනාඩි 4 - 6 | උඩරට නර්තන සම්ප්‍රදායට අයත් වන්නම් 18 න් එකක් විය යුතුය.<br>අත්වැල් ගායනය - 02කි. (ළමා සමාජ දරුවන් විය යුතුය.)<br>වාදක මණ්ඩලය 02කි. (ශිල්පීන් යොදා ගත හැකිය.) |
| 07 | පහතරට - ඒකල ගැහැණු /පිරිමි | 11 - 14<br>15 - 18 | විනාඩි 4 - 6 | පහතරට නර්තන සම්ප්‍රාදායට අයත් වන්නම් 32 න් එකක් විය යුතුය.<br>අත්වැල් ගායනය - 02කි. (ළමා සමාජ දරුවන් විය යුතුය. )<br>වාදක මණ්ඩලය 02කි. ( ශිල්පීන් යොදා ගත හැකිය.) |
| 8 | කථික | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | වැඩසටහනට අදාළ මාතෘකා දි/ලේ කාර්යාලයෙන් සැපයිය යුතුයි. |
| 09 | නිවේදක (වැඩසටහනක් මෙහෙයවීම) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | කටහඬ / වචන උච්චාරණය / ඉදිරිපත් කිරීම කෙරේ අවධානය යොමු කිරීම. |
| 10 | චිත්‍ර | 7 - 10<br>11 - 14<br>15 - 18 | පැය 03 | මාධ්‍යය - පැස්ටල් / දිය සායම්<br>ප්‍රමාණය - අඟල් 18 x 14<br>බ්‍රිසිට්ල් බෝඩ් හෝ ඩ්‍රෝවින් කඩදාසි |
| 11 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) | 7 - 10 | පැය 03 | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 300 - 350 |
| | | 15 - 18 | | වචන 500 – 550 ළමා කතන්දර<br>(මාතෘකා විවෘතයි) ස්වාධීන නිර්මාණාත්මක කථා අංගයක් විය යුතුය. ඒ - 4 කඩදාසිය භාවිතා කළ යුතුය. සහතික කළ උප්පැන්න සහතිකය හා ලකුණු ලබා දීමේ ආකෘතිය පොතෙහි නොගැලවෙන සේ අමුණා තිබීම අනිවාර්යය වේ. **"ළමා කතන්දර නිර්මාණය"** පොත් පිංචක් ලෙස සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 12 | කෙටි නාට්‍ය (සමෘද්ධි වැඩසටහනට අදාළව සහ වර්තමානයට ගැලපෙන කාලීන මාතෘකා) | විවෘත | විනාඩි 08 - 10 | උදා:- ප්‍රචාරණ මාධ්‍යයක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය. **අවම වේදිකා සැරසිලි භාවිතා කළ යුතුවන අතර ඒ සඳහාද ලකුණු හිමි වේ. (වේදිකාව සූදානම් කිරීම සඳහා විනාඩි 05 කට වඩා වැඩි කාලයක් යොදා ගන්නේ නම් එය ලකුණු අඩු වීමට හේතුවක් වේ.** |
| 13 | ගද්‍ය රචනා | 7 - 10 | පැය 2 කි | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 250 - 300 |
| | | 15 - 18 | | වචන 450 - 500 පරිසරය සුරැකීම, ස්වභාව සෞන්දර්ය ජන ජීවිතය සමඟ බැඳී ඇති අයුරු වැනි මාතෘකාවක් ඔස්සේ වර්ණනාත්මකව රචනාව ගොඩ නැගිය යුතුය. ගද්‍ය රචනාවේ මුල් පිටුවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතු බවට තරඟකරුවන් දැන්වත් කළ යුතුය. |
| 14 | පද්‍ය රචනා | 7 - 10 | පැය 2 කි. | පේළි හතරේ කවි 06 යි |
| | | 11 - 14 | | පේළි හතරේ කවි 08 යි |
| | | 15 - 18 | | පේළි හතරේ කවි 12 යි |
| | | | | වචන 450 - 500 පරිසරය සුරැකීම, ස්වභාව සෞන්දර්ය ජන ජීවිතය සමඟ බැඳී ඇති අයුරු වැනි මාතෘකාවක් ඔස්සේ වර්ණනාත්මකව පද්‍ය පන්තිය ගොඩ නැගිය යුතුය. පද්‍ය පන්තියේ මුල් පිටුවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතු බවට තරඟකරුවන් දැන්වත් කළ යුතුය. |

දමිළ මාධ්‍ය තරඟ ඉසව් - ඇමුණුම 04

| අනු අංකය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | කාලය | වෙනත් |
|---|---|---|---|---|
| 01 | සරල ගී ගායනය | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5 | මව් ගුණ, පිය ගුණ ගීතයක් හෝ දේශාභිමාන ගීතයක් ගායනා කළ යුතුය. |
| 02 | ජන ගායනය (ඒකල) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | ආඝාතාත්මක (තාල සහිත) හා අනාඝාතාත්මක (තාල රහිත) වශයෙන් ප්‍රාසංගිකව ඉදිරිපත් කළ යුතුයි. (ධීවර ගීත, ගොයම් ගී, ඕංචිලි වාරම්) |
| 03 | ජන නැටුම් (සමූහ හෝ මිශ්‍ර) අම්මන්කුත්තු, කුරහන්,කාවඩි (කෝලාට්ටම් ශෛලීන් ආශ්‍රයෙන් නිර්මාණය කළ යුතුය.) | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 6 - 8 | නර්තන - 12<br>අත්වැල් ගායනය - 04 (ළමා සමාජ දරුවන් විය යුතුයි)<br>වාදක මණ්ඩලය -04 (ශිල්පීන් යොදා ගත හැකිය)<br>කණ්ඩායමේ උපරිම සංඛ්‍යාව 16 ක් විය යුතුයි. අවමය 10 ක් විය යුතුය. |
| 04 | නිවේදක | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 - 6<br>විනාඩි 5 - 7 | කටහඬ / වචන උච්චාරණය ඉදිරිපත් කිරීම කෙරේහි අවධානය යොමු කළ යුතුය. |
| 05 | කථික | 7 - 10<br>11 - 14<br>15 - 18 | විනාඩි 3 - 5<br>විනාඩි 4 -6<br>විනාඩි 5 - 7 | වැඩසටහනට අදාළ මාතෘකා දි/ලේ කාර්යාලයෙන් සැපයිය යුතුය. |
| 06 | චිත්‍ර | 7 - 10<br>11 - 14<br>15 - 18 | පැය 03 | මාධ්‍යය - පැස්ටල් / දිය සායම්<br>ප්‍රමාණය - අඟල් 18 x 14<br>බ්‍රිසිට්ල් බෝඩ් හෝ ඩ්‍රෝවින් කඩදාසි |
| 07 | ළමා කතන්දර (මාතෘකා විවෘතයි) | 7 - 10 | පැය 03 | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 300 - 350 |
| | | 15 - 18 | | වචන 500 – 550 ළමා කතන්දර<br>(මාතෘකා විවෘතයි) ස්වාධීන නිර්මාණාත්මක කථා අංගයක් විය යුතුය. ඒ - 4 කඩදාසිය භාවිතා කළ යුතුය. සහතික කළ උප්පැන්න සහතිකය හා ලකුණු ලබා දීමේ ආකෘතිය පොතෙහි නොගැලවෙන සේ අමුණා තිබීම අනිවාර්යය වේ. **"ළමා කතන්දර නිර්මාණය"** පොත් පිංචක් ලෙස සකස් කළ යුතුය. |

| | | | | |
|---|---|---|---|---|
| 08 | කෙටි නාට්‍ය (සමෘද්ධි වැඩසටහනට අදාළව සහ වර්තමානයට ගැලපෙන කාලීන මාතෘකා) | | විනාඩි 08 - 10 | උදා:- ප්‍රචාරණ මාධ්‍යයක් නොවන හුදු නාට්‍යමය ගුණය ඉස්මතු වන අයුරින් නිර්මාණය විය යුතුය. අවම වේදිකා සැරසිලි භාවිතා කළ යුතුවන අතර ඒ සඳහාද ලකුණු හිමි වේ. (වේදිකාව සූදානම් කිරීම සඳහා විනාඩි **05**කට වඩා වැඩි කාළයක් යොදා ගන්නේ නම් එය ලකුණු අඩු වීමට හේතුවක් වේ. |
| 09 | ගද්‍ය රචනා | 7 - 10 | පැය 2 කි | වචන 150 - 200 |
| | | 11 - 14 | | වචන 250 - 300 |
| | | 15 - 18 | | වචන 450 - 500<br>පරිසරය සුරැකීම, ස්වභාව සෞන්දර්ය ජන ජීවිතය සමග බැඳී ඇති අයුරු වැනි මාතෘකාවක් ඔස්සේ වර්ණනාත්මකව රචනාව ගොඩනැගිය යුතුය. ගද්‍ය රචනාවේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතු බවට තරඟකරුවන් දැන්වත් කළ යුතුය. |
| 10 | පද්‍ය රචනා | 7 - 10 | පැය 2 කි | පේළි හතරේ කවි 06 යි |
| | | 11 - 14 | | පේළි හතරේ කවි 08 යි |
| | | 15 - 18 | | පේළි හතරේ කවි 12 යි |
| | | | | වචන 450 - 500 පරිසරය සුරැකීම, ස්වභාව සෞන්දර්ය ජන ජීවිතය සමග බැඳී ඇති අයුරු වැනි මාතෘකාවක් ඔස්සේ වර්ණනාත්මකව පද්‍ය පන්තිය ගොඩනැගිය යුතුය. පද්‍ය පන්තියේ සම්පූර්ණ නම, වයස් කාණ්ඩය, දිස්ත්‍රික්කය, ප්‍රාදේශීය ලේකම් කොට්ඨාශය, ළමා සමාජයේ නම සඳහන් කළ යුතු බවට තරඟකරුවන් දැන්වත් කළ යුතුය. |

**කාල රාමුව, ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම - ඇමුණුම 05**

ඉහත දක්වා ඇති පරිදි සිංහල හා දමිළ මාධ්‍ය තරඟ බැංකු සංගම්, ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ක්‍රියාත්මක කළ යුතුයි. ඒ ඒ මට්ටම් වලදී අදාළ නිළධාරින් විධිමත්ව තරඟය පැවැත්වෙන බවට වගබලා ගත යුතුය.

| අදියර | ක්‍රියාත්මක කිරීමේ වගකීම හා අනුමත කිරීම | පැවරෙන වගකීම | තරගය පැවැත්විය යුතු කාලය |
|---|---|---|---|
| කලාප මට්ටම | වසමේ සමෘද්ධි සංවර්ධන නිළධාරි/සමාජ සංවර්ධන සහකාර/ සමෘද්ධි කලාප කළමනාකරු | • සහභාගිවන තරඟ කරුවන් සඳහා බැංකු ගිණුම් විවෘත කිරීම.<br>• උප්පැන්න සහතිකය පරික්ෂා කිරීම හා ජයග්‍රාහි නාම ලේඛන සකස් කිරීම<br>• ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට 2019.07.20 වන දිනට පෙර ලබාදීම සම්බන්ධව වගකිම ගැනීම.<br>• අධීක්ෂණය සඳහා කළමනාකාර අධ්‍යක්ෂ හෝ මූලස්ථාන කළමනාකරු සහභාගි විය යුතුවේ. | 2019 ජූලි 10 පෙර |
| ප්‍රාදේශීය මට්ටම | ප්‍රාදේශීය ලේකම්/ සහකාර ප්‍රාදේශීය ලේකම් මූලස්ථාන කළමනාකරු / කළමනාකාර අධ්‍යක්ෂ / සමාජ සංවර්ධන සහකාර | • බැංකු ගිණුම් උප්පැන්න සහතිකය පරික්ෂා කිරීම.<br>• කලාපයෙන් ලබා දුන් ජයග්‍රාහි නාම ලේඛන පරික්ෂා කර නිවැරදි නාමලේඛන අනුව තරඟාවලිය පැවැත්වීම<br>• ජයග්‍රාහි නාම ලේඛන සකස් කිරීම<br>• එම නාම ලේඛන දිස්ත්‍රික්කය වෙත 2019/09/10 දිනට පෙර ලබා දීම සම්බන්ධව වගකිම ගැනීම. | 2019 අගෝස්තු 30 ට පෙර |
| දිස්ත්‍රික් මට්ටම | දිස්ත්‍රික් සමෘද්ධි අධ්‍යක්ෂ සමාජ සංවර්ධන විෂය කළමනාකරු, | • බැංකු ගිණුම් උප්පැන්න සහතික පරික්ෂා කිරීම.<br>• ප්‍රාදේශීය කාර්යාලයෙන් ලබාදුන් ජයග්‍රාහි නාම ලේඛන පරික්ෂා කර නිවැරදි නාම ලේඛන අනුව තරඟාවලිය පැවැත් වීම<br>• ජයග්‍රාහි නාම ලේඛන සකස් කිරීම<br>• එම නාම ලේඛන ප්‍රධාන කාර්යාලය වෙත 2019/10/10 දිනට පෙර ලබා දීම සම්බන්ධව වගකිම ගැනීම.<br>• අධීක්ෂණය සඳහා සමාජ සංවර්ධන නියෝජ්‍ය අධ්‍යක්ෂ ප්‍රාදේශීය කාර්යාලයේ විෂයට සම්බන්ධ වූ කළමණාකරුවන් සහභාගී විය යුතුවේ. | 2019 සැප් 30 ට පෙර |

| | | | |
|---|---|---|---|
| ජාතික මට්ටම | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන හා පරිසර), අංශයේ සියලුම නිළධාරීන් | බැංකු ගිණුම්, උප්පැන්න සහතිකය, ජයග්‍රාහි නාම ලේඛන පරික්ෂා කර ජාතික තරඟාවලිය පැවැත් වීම. | 2019 නොවැ. 10 ට පෙර |
| ජාතික උත්සවය | නියෝජ්‍ය අධ්‍යක්ෂ (සමාජ සංවර්ධන හා පරිසර), අංශයේ සියලුම නිළධාරීන් | ජාතික තරගාවලියෙන් තෝරා ගන්නා ජයග්‍රාහකයින් ඇගයීම. | 2019 දෙසැම්බර් |

මෙම තරඟාවලිය පැවැත්වෙන කාල සීමාවන් තුලදි ඉහත පරිදි අදාල නිලධාරින් වගකීම් ගැනිම අනිවාර්ය වන අතර අදාළ තරඟාවලි පැවැත්වෙන දිනවලදී සඳහන් කර ඇති පරිදි නිළධාරි නියෝජනයක් සහභාගි කර වීම අනිවාර්ය වේ.

i.දිස්ත්‍රික් මට්ටම දක්වා තරඟ පැවැත්වීමෙන් අනතුරුව ඒ ඒ තරඟ ඉසව් වලින් , අදාළ වයස් කාණ්ඩ වලින් ප්‍රථම ස්ථානය දිනා ගත් දරුවන් ජාතික තරඟය සඳහා ඉදිරිපත් කළ යුතු වේ.

ii.ඉහත කාල පරිච්ඡේදයට අනුව තරඟාවලියේ අදාළ මට්ටම් නිම කළ යුතු අතර දිස්ත්‍රික් තරඟයේ තරඟ ප්‍රතිඵල 2019.10.10 වන දිනට ප්‍රථම දී ඇති ආකෘතියට අනුව පැහැදිලිව සකස් කර ප්‍රධාන කාර්යාලයේ සමාජ සංවර්ධන හා පරිසර අංශය වෙත එවිය යුතුය.

iii.ජාතික තරඟය සඳහා නාමලේඛන ඉදිරිපත් කිරීමේදී තරඟකරුවන්ගේ නම් නිවැරදිව සටහන් කර එවීමට විශේෂයෙන් සැලකිලිමත් විය යුතුය. දරුවන්ගේ නම් වල මුලකුරු ඉංග්‍රිසි අක්ෂර වලින් සටහන් කළ යුතුය. දමිළ මාධ්‍ය දරුවන්ගේ සම්පූර්ණ නම් ඉංග්‍රිසි මාධ්‍යයෙන් හා දමිළ මාධ්‍යයෙන් එවීමට කටයුතු කරන මෙන් ඉල්ලමි. **(<u>පහත ආකෘතිය භාවිතා කරමින් පමණක් අදාළ තරඟ ප්‍රතිඵල එවීමට කටයුතු කළ යුතු බවට අවධාරණය කරන අතර මින් පරිබාහිරව එවනු ලබන කිසිදු ප්‍රතිඵල ලේඛනයක් බාර නොගන්නා බව වැඩිදුරටත් දන්වමි.</u>**

උදාහරණ :-

| අනු අංකය | දිස්ත්‍රික්කය | ප්‍රා / ලේ / කොට්ඨාශය | තරඟ ඉසව්ව | වයස් කාණ්ඩය | තරඟකරුගේ නම | ලබා ගත් ස්ථානය |
|---|---|---|---|---|---|---|
| ඒකල තරඟ සඳහා | | | | | | |
| 01 | ගම්පහ | ගම්පහ | කවීක | 7 - 11 | A.D.ඉෂිනි භාෂිකා කොතලාවල | ප්‍රථම |
| | | | | | | |
| 02 | මාතර | මාතර | ජන නැටුම් (සමූහ / මිශ්‍ර) | 15 - 18 | A.D.නයනා අනුත්තරා පෙරේරා | ප්‍රථම |
| | | | | | අත්වැල් ගායනා සඳහා නම් ද මේ අයුරින් 1 - 16 දක්වා නිවැරදිව සටහන් කරන්න. | |